සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025/ Second Term Test - 2025**

33522

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | භූගෝල විද්‍යාව I, II | කාලය / நேரம் / Time | පැය 02යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

- ➢ **ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.**
- ➢ **ඒ ඒ කොටස් සඳහා දී ඇති උපදෙස් හොඳින් කියවා පිළිතුරු සපයන්න.**

---

- ➢ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
- ➢ **මෙම කොටස ප්‍රශ්න 20කින් සමන්විත වේ.**

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**01.** පෘථිවියේ යම් ස්ථානයක පිහිටීම භූගෝලීය ඛණ්ඩාංක පදනම් කරගෙන දැක්වීම ........................................ පිහිටීම යි. (සාපේක්ෂ / නිරපේක්ෂ / භෞතික )

**02.** ........................................ ලොව විශාලතම වාරිමාර්ග පද්ධතියකට හිමිකම් කියයි. (ඩුබායි / ජපානය / පාකිස්ථානය )

**03.** මුහුදු මට්ටමේ සිට මීටර් ........................................ දක්වා උස්ව විහිදී ඇති ප්‍රදේශය වෙරළබඩ තැනිතලාව යි. (20 / 30 / 300)

**04.** ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් සකස් කරනු ලබන්නේ ........................................ දෙපාර්තමේන්තුව විසිනි. (මාර්ග සංවර්ධන/ මිනින්දෝරු / අධ්‍යාපන)

**05.** ග්‍රාමීය මෙන් ම නාගරික ලක්ෂණ මිශ්‍රව ........................................ ජනාවාස නිර්මාණය වේ. (අතරමැදි / මිශ්‍ර / ගැමි නාගරික)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **" නි "** යන්න වටා ද වැරදි නම් **" වැ "** යන්න වටා ද රවුමක් අඳින්න.

**06.** ආසියා මහාද්වීපය ස්වාධීන රාජ්‍ය 54කින් සමන්විත වේ. (නි / වැ)

**07.** ආසියා මහාද්වීපය නැගෙනහිර දේශාංශ $25^0 - 180^0$ අතර පිහිටා ඇත. (නි / වැ)

**08.** චීනය, කොරියාව, සිංගප්පූරුව යන රටවල කොකසොයිඩ් මානව වර්ගය ජීවත් වේ. (නි / වැ)

**09.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න 103ක් පිහිටා ඇත. (නි / වැ)

**10.** භෞතික හා මානව භූ දර්ශනයන් අතර සෘජු සම්බන්ධතාවයක් නැත. (නි / වැ)

- අංක **11** සිට **13** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ආසියා මහාද්වීපය හා යුරෝපා මහාද්වීපය එක්ව ගත් විට ........................................ ලෙස හඳුන්වයි.

**12.** ශ්‍රී ලංකාවේ බහුල ලෙස ........................................ ජලවහන රටාව දක්නට ලැබේ.

**13.** රටක ජන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂභාවය අනුව දැක්වීම ........................................ බව ලෙස හඳුන්වයි.

- අංක **14** සිට **15** තෙක් දී ඇති ප්‍රශ්නවල **"අ"** සහ **"ආ"** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **"අ"** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව **"ආ"** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට **නිවැරදි අනුපිළිවෙළ** දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියා දක්වන්න.**

**14.**

| "අ" කඳු වැටි | "ආ" උන්නතාංශය (මීටර්) |
|---|---|
| 01. මකාලු | A. 8848 |
| 02. කන්චන්ජුංගා | B. 8586 |
| 03. එවරස්ට | C. 8462 |
| | D. 8901 |

(1) A,B,D (2) C,A,D (3) C,B,A (4) D,C,A (......)

**15.**

| "අ" ගඟ | "ආ" මුහුද හෝ සාගර |
|---|---|
| 01. යුරල් ගඟ | A. කැස්පියන් මුහුද |
| 02. යෙනිසි | B. ආක්ටික් සාගරය |
| 03. යුප්‍රටීස් | C. එරල් මුහුද |
| | D. පර්සියන් බොක්ක |

(1) A,B,C (2) A,B,D (3) A,C,D (4) C,B,A (......)

- අංක **16** සිට **20** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**16** ඩුබායි මෝල් (Dubai Mall) යනුවෙන් හඳුන්වන්නේ,
(1) කාර්යබහුල ම ගුවන්තොටුපොළකි. (2) නිදහස් වෙළඳ වරායකි.
(3) ජාත්‍යන්තර සේවා මධ්‍යස්ථානයකි. (4) විශාලතම වෙළඳ මධ්‍යස්ථානයකි. (......)

**17** ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය පවත්වනු ලබන ආයතනය වන්නේ,
(1) සංචාරක සංවර්ධන අධිකාරිය යි. (2) ප්‍රවාහන අමාත්‍යාංශය යි.
(3) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව යි. (4) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යි. (......)

**18** උස් භූමියක පිහිටි සමතලා භූමිය
(1) නිම්නය වේ. (2) කපොල්ල වේ.
(3) සානුව වේ. (4) හුදකලා කන්ද වේ. (......)

**19** ආසියා මහාද්වීපයට අයත් ප්‍රමාණයෙන් විශාලතම දූපතක් වන්නේ,
(1) මැඩගස්කරය වේ. (2) නිකොබාර් වේ.
(3) ඉන්දුනීසියාව වේ. (4) බ්‍රිතාන්‍ය දූපත් වේ. (......)


**20** ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය හා තෙත් කලාපීය භූ දර්ශනය වෙන් කරනු ලබන ගංගා දෙක වන්නේ,
(1) වලවේ ගඟ හා නිල්වලා ගඟ යි. (2) මහ ඔය හා නිල්වලා ගඟ යි.
(3) දැදුරු ඔය හා මැණික් ගඟ යි. (4) වලවේ ගඟ හා දැදුරු ඔය යි. (......)

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- මෙහි **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- ප්‍රශ්න අංක **02** සිට **07** තෙක් දී ඇති ප්‍රශ්න අතුරින් ප්‍රශ්න **හතරක් පමණක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු **මුළු ප්‍රශ්න** සංඛ්‍යාව **පහකි.**

**01. (අ)** පහත දී ඇති සිතියම ඇසුරින් **(i)** සිට **(viii)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) කැස්පියන් මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සයිබීරියානු තැන්න දැක්වෙන අක්ෂරය ලියන්න.

(iii) වොල්ගා ගංගාව දැක්වෙන්නේ කවර අක්ෂරයකින් ද?

(iv) M අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න.


(v) ඩෙකාන් සානුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(vi) පිලිපීන දූපත් දැක්වෙන අක්ෂරය කුමක් ද?

(vii) W අක්ෂරය මගින් දැක්වෙන මුහුද නම් කරන්න.

(viii) අල්තායි කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 01 X 08 = 8 )




**(ආ)** සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඩෙල්ෆ්ට් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) මඩකලපුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) දැදුරු ඔය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(iv) පුත්තලම කලපුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) කන්කසන්තුරේ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(vi) බදුල්ල දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(vii) ගල්ඔය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(viii) M අක්ෂරය මගින් දැක්වෙන දිස්ත්‍රික්කය නම් කරන්න.

(ලකුණු 01 X 08 = 8 )

**(ඉ)** පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ඩුබායි ආර්ථිකයේ පදනම කුමක් ද?

(ii) පුළුල් විවරයක් සහිතව ගොඩබිම දෙසට නෙරා ගිය කරදිය පිරුණු මුහුදු ප්‍රදේශය හඳුන්වන නම කුමක් ද?

(iii) ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය කොපමණ ද?

(iv) කඩොලාන ශාක පද්ධතිවල දැකිය හැකි ලක්ෂණයක් ලියන්න (ලකුණු 01 X 4 = 4 යි)

02 (i) ආසියා මහාද්වීපයේ ඇති සුවිශේෂී භෞතික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත ඒවාට කෙටි පිළිතුරු සපයන්න.


a ලොව වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය

b ලොව උසින්ම පිහිටි සානුව

c ලොව විශාලතම විල (ලකුණු 03 යි)

(iii) a ආසියා මහාද්වීපයේ අසම ජන ව්‍යාප්තියක් ඇති වීමට බලපාන භෞතික සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

b ඉහත (iii) a හි ඔබ නම් කළ සාධකයක් අසම ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)




03 (i) ශේෂ කන්දක් යනු කුමක් දැ'යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) යාබද සිතියමෙහි A, B හා C ලෙස දක්වා ඇති කඳු වැටි තුන පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) a මධ්‍යම කඳුකර භූ විෂමතා කලාපය තුළ ඇති භූ විෂමතා ලක්ෂණ තුනක් නම් කර ඒවාට උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 03 යි)

b වෙරළබඩ තැන්නෙහි ඇති පහත සඳහන් භූ විෂමතා ලක්ෂණවලින් දෙකක් රූප සටහන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

01. බොක්ක 02. තුඩුව 03. කලපුව 04 දූපත (ලකුණු 02 යි)

04 (i) දේශගුණය යනු කුමක් දැ'යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) ලොව ප්‍රධාන දේශගුණික කලාපවල උප දේශගුණික වර්ග ඇති වීමට හේතුවන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) a පෘථිවියේ ඇති ප්‍රධාන දේශගුණික කලාප තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

b ඉහත (iii) a හි ඔබ නම් කළ එක් දේශගුණික කලාපයක ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

05 (i) වර්ෂාපතනය යනු කුමක් දැ'යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) a ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රමය නම් කරන්න. (ලකුණු 01 යි)

b එම වර්ෂාපතනය ලැබෙන කාල සීමාව ලියන්න. (ලකුණු 01 යි)

C වාර්ෂික වර්ෂාපතනය අඩු ප්‍රදේශවල ජල භාවිතය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දක්වන්න. (ලකුණු 03 යි)

06 (i) පතන ශීඝ්‍රතාවය යනු කුමක් දැ'යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්වීම්වලට බලපාන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) a ශ්‍රී ලංකාවේ ඇති ස්වාභාවික වෘක්ෂලතා කලාප තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

b ඔබ ඉහත(iii) a හි නම් කළ වෘක්ෂලතා කලාපයක ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

07 (i) ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපීය භූ දර්ශනය උපයෝගී කරගෙන කරනු ලබන ප්‍රධාන මානව ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කඳුකර භූ දර්ශනය තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) යාපනය අර්ධද්වීපය උපයෝගී කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a ජනතාව තම ආර්ථිකය ශක්තිමත් කිරීමට බහුලව ම භාවිත කරන ශාකය කුමක් ද? (ලකුණු 01 යි)

b එම ශාකය ආශ්‍රිත නිෂ්පාදනයක් ලියන්න. (ලකුණු 01 යි)

C එම කලාපයේ කෘෂිකර්මාන්තයට ජලය ලබා ගන්නා ප්‍රධාන ක්‍රමය කුමක් ද? (ලකුණු 01 යි)

d එහි බහුලව ම වගා කරන භෝගයක් නම් කරන්න. (ලකුණු 02 යි)